**සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

**දේශීය වෛද්‍ය අංශය**

# ආයුර්වේද වෛද්‍ය සභාව

# වාර්ෂික වාර්තාව - 2017

# පටුන


| | |
|---|---|
| ආයුර්වේද වෛද්‍ය සභාවේ දැක්ම, මෙහෙවර හා පරමාර්ථය | 4 |
| අභිමතාර්ථ, ආයුර්වේද වෛද්‍ය සභාවේ හැඳින්වීම හා කාර්යභාරය | 5 |
| ආයුර්වේද වෛද්‍ය සභාවේ සාමාජිකයින් 2017 | 6 |
| ආයුර්වේද වෛද්‍ය සභාවේ සංවිධාන ව්‍යුහය | 7 |
| ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්ය සාධනය | 8 |
| මූල්‍ය සම්පාදනය | 8 |
| ප්‍රතිපත්ති සම්පාදනය හා විමර්ශන හා විශේෂ වෛද්‍ය මණ්ඩල | 9 - 10 |
| ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම හා භෛෂජ්‍යකවරුන් ලියාපදිංචි කිරීම, ව්‍යවස්ථා සම්පාදනය, | 10 - 14 |
| ආයුර්වේද වෛද්‍ය සභාවේ නිල වෙබ් අඩවිය | 14 |
| 2017 වර්ෂය තුළ ආයුර්වේද වෛද්‍ය සභාව මගින් ගනු ලැබූ හා ගෙන තිබූ තීරණවලට අනුගතව ක්‍රියාත්මක කරනු ලැබූ වෙනත් පියවර | 15 16 |
| 2017 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය | 17 - 19 |
| 2017 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | 20 - 21 |
| 2017 මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 22 - 23 |
| 2017 විගණකාධිපති වාර්තාව | 24 - 33 |
| සංස්ථාපිත තොරතුරු | 34 |
| ස්තුතිය | 35 |

**දැක්ම**

වෘත්තිය ගුණාත්මකභාවය හා
අභිමානය සුරක්ෂත කරමින්
ශ්‍රී ලංකා ආයුර්වේද ක්ෂේත්‍රයේ උත්තරීතර
ආයතනය බවට පත්වීම.

**මෙහෙවර**

වෘත්තිය ආචාරධර්ම වලට අනුගත වූ උපරිම
මහජන සේවාවක් සලසමින්
ආයුර්වේද ක්ෂේත්‍රයේ ගුණාත්මක සංවර්ධනය
සඳහා අවශ්‍ය නෛතික පදනම සුරක්ෂිත කිරීම.

**පරමාර්ථය**

1961 අංක 31 දරණ ආයුර්වේද පනතෙහි
විධිවිධාන වලට අනුකූලව ආයුර්වේද ක්ෂේත්‍රයේ
ගුණාත්මක සංවර්ධනය සංස්ථාපනය කිරීමට අවශ්‍ය
දැනුම, කුසලතාවය හා පළපුරුද්ද සහිත
වෘත්තිකයින් වෙත
නෛතික අධිකාරිත්වය පිරිනැමීම
සහ වෘත්තියේ ගරුත්වය සහ ගුණාත්මකභාවය
සුරක්ෂිත කිරීම.

**අභිමතාර්ථ ඃ-**

1. 1961 අංක 31 දරණ ආයුර්වේද පනතින් සභාවට පවරා ඇති බලතල බලාත්මක කිරීම.
2. ආයුර්වේද ක්ෂේත්‍රයේ වෘත්තිමය නිපුණත්වය නඟාලීමට ප්‍රමිති / නිර්ණායක සකස් කිරීම හා පවත්වාගෙන යාම.
3. ආයුර්වේද වෘත්තිකයන්ගේ චර්යාව විධිමත් ලෙස පවත්වා ගැනීමට අවශ්‍ය ආචාරධර්ම හා ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම.
4. ආයුර්වේද ක්ෂේත්‍රයේ වෘත්තිය චර්යාවන් නිර්ණය කිරීම හා පාලනය කිරීම.
5. ආයුර්වේද වෛද්‍ය සභාවේ සම්පත් හා පහසුකම් යාවත්කාලීන කිරීම මඟින් එහි කාර්ය සාධනය වැඩි දියුණු කිරීම.

**1961 අංක 31 දරණ ආයුර්වේද පනත යටතේ ස්ථාපිත ආයුර්වේද වෛද්‍ය සභාවේ හැඳින්වීම හා කාර්යභාරය**

1927 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අනුකාරක සභා නිර්දේශය අනුව 1928 දී පිහිටවනු ලැබූ ස්වදේශීය වෛද්‍ය මණ්ඩලය ශ්‍රී ලාංකේය ආයුර්වේද ක්ෂේත්‍රයේ ප්‍රථම නෛතික අධිකාරී බලය ලත් ආයතනය විය. 1935 අංක 46 දරණ ලංකායුර්වේද වෛද්‍යානුශාසක සභා ආඥා පනත මඟින් ස්ථාපනය කරන ලද ආයුර්වේද වෛද්‍ය සභාව 1941 අංක 17 දරණ ස්වදේශිය වෛද්‍ය ආඥා පනතේ (1945 අංක 49 හා 1949 අංක 49 මඟින් සංශෝධිත) විධිවිධාන යටතේ නැවත ස්ථාපනය කරනු ලැබීය. දැනට ක්‍රියාත්මක ආයුර්වේද වෛද්‍ය සභාව 1961 අංක 31 දරණ ආයුර්වේද පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ ව්‍යවස්ථාපිත ආයතනයකි.

ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්යභාරය ;

(අ). ආයුර්වේදය උගන්වන යම් ආයතනයක් මේ 1961 අංක 31 දරණ ආයුර්වේද පනතේ කාර්යයන් සඳහා ඇමතිවරයා විසින් අනුමත කළ යුතුද යන්න ඇමතිවරයාට නිර්දේශ කිරීම.

(ආ). ආයුර්වේද වෛද්‍යවරුන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම.

(ඇ). ආයුර්වේද ඖෂධ සංයෝජකයන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම.

(ඈ). ආයුර්වේද සාත්තු සේවකයන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම.

(ඉ). එසේ ලියාපදිංචි කිරීම් අවලංගු කිරීම හෝ අත්හිටුවීම, හා

(ඊ). 1. ආයුර්වේද වෛද්‍යවරුන, ආයුර්වේද ඖෂධ සංයෝජකයන් හා ආයුර්වේද සාත්තු සේවකයින්ගේ වෘත්තිය හැසිරීම විධිමත් කිරීම හා පාලනය කිරීම සඳහා,


2. මේ වගන්තියේ (ආ) සිට (ඉ) දක්වා ඡේදවල සඳහන් කරුණු වලින් යමක් සඳහා ව්‍යවස්ථා සම්පාදනය කිරීම.

**2017 වර්ෂයේ 19 වන වෛද්‍ය සභාවේ සභා සාමාජිකයින්**

| | | |
|---|---|---|
| 1. | **ආයුර්වේද කොමසාරිස්, එල්.එච්. තිලකරත්න මයා - 2017 අප්‍රේල් දක්වා** | **සභාපති** |
| 2. | **ආයුර්වේද කොමසාරිස් , එම්.ඩී.එම්.ඩී. කරුණාතිලක මිය - 2017 අප්‍රේල් සිට** | **සභාපති** |
| 3. | වෛද්‍ය එස්.ඩී. හපුආරච්චි මිය<br>අධ්‍යක්ෂ, දේශීය වෛද්‍ය විද්‍යායතනය | උප සභාපති |
| 4. | වෛද්‍ය ආර්. එල්. රණසිංහ මයා - 2017 අගෝස්තු දක්වා | ලේඛකාධිකාරී |
| 5. | වෛද්‍ය බී.ඩබ්. පද්මශාන්ති වික්‍රමරත්න මිය - 2017 අගොස්තු සිට | ලේඛකාධිකාරී |
| 6. | වෛද්‍ය බැසිල් රංජිත් ප්‍රනාන්දු මයා | සාමාජික |
| 7. | වෛද්‍ය ඒ.එච්.එම්. මවුජුඩ් මයා | සාමාජික |
| 8. | එච්.එන්.ආර්. හෙට්ටිආරච්චි මයා | සාමාජික |
| 9. | වෛද්‍ය කේ.වි.ඒ.සි විතානාරච්චි මයා | සාමාජික |
| 10. | වෛද්‍ය එස්.ඒ.ඒ.සී. අබේසේකර මිය | සාමාජික |
| 11. | වෛද්‍ය එස්. එච්. එම්. සේනබණ්ඩා මහතා | සාමාජික |
| 12. | වෛද්‍ය අයි. ජී. පි. ආර්. කුලනාත මිය | සාමාජික |
| 13. | වෛද්‍ය එස්.එස්. ගුණවර්ධන මයා | සාමාජික |
| 14. | වෛද්‍ය සුජීව විතානගේ මයා | සමාජික |
| 15. | වෛද්‍ය නන්ද විජේරත්න මයා | සමාජික |
| 16. | ජී.එස්.එල්.වික්‍රමාරච්චි මයා | සමාජික |
| 17. | වෛද්‍ය ඩැනිස්ටර් එල්. පෙරේරා (2017 සැප්තැම්බර් සිට ඔක්තෝබර් දක්වා ) | සමාජික |
| 18. | වෛද්‍ය ජී. විජේරත්න මයා (2017 ඔක්තෝබර් සිට ) | සමාජික |
| 19. | භාණ්ඩාගාර නිරීක්ෂක, එම්. ආර්. කේ.පී.විජේවන්ත මිය<br>අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව | සාමාජික |

මෙම වර්ෂය තුළ ආයුර්වේද වෛද්‍ය සභා රැස්වීම් 12 ක් පවත්වා ඇත.

## ආයුර්වේද වෛද්‍ය සභාවේ සංවිධාන ව්‍යුහය සාමාජික සංඛ්‍යාව



## ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්ය සාධනය - 2017

### 01. මූල්‍ය සම්පාදනය


2017 වර්ෂය වෙනුවෙන් ආයුර්වේද වෛද්‍ය සභාව වෙත රුපියල් ලක්ෂ හැටක (6,000,000/-) මුදලක් රජයේ ප්‍රතිපාදන වශයෙන් ලබා දී ඇත.

2017 වර්ෂයේ ආයුර්වේද වෛද්‍ය සභාව වෙත විවිධ ක්ෂේත්‍රයන් මඟින් ලැබූ ආදායම **රු. 4,063,718/-ක්** වූ අතර මුළු වියදම **රු 11,540,622 /-** ක් විය. 2017 වර්ෂයේ ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්ය සාධනය පිළිබඳ වාර්තාවක් ආදායම් වියදම් ගිණුමෙන් ද 2017.12.31 දිනට සභාවේ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවක් ශේෂ පත්‍රයෙන් ද ඉදිරිපත් කර ඇත. මීට අමතරව 2017 වර්ෂය තුළ මුදල් ගලා ඒම හා ගලායාම පිළිබඳ තතත්වය මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය මඟින් ඉදිරිපත් කර ඇත.

**වාර්ෂික ආදායම, වියදම හා රජයේ ප්‍රතිපාදන**

| අයිතමය | 2013 රුපියල් | 2014 රුපියල් | 2015 රුපියල් | 2016 රුපියල් | 2017 රුපියල් |
|---|---|---|---|---|---|
| රජයේ ප්‍රතිපාදන | 5,000,000.00 | 7,000,000.00 | 4,500,000.00 | 5,250,000.00 | 6,000,000.00 |
| උපයාගත් ආදායම | 4,423,774.00 | 5,503,344.00 | 6,250,810.00 | 8,040,946.00 | 4,063,718.00 |
| **මුළු ලැබීම** | **9,423,774.00** | **12,503,344.00** | **10,750,810.00** | **13,290,946.00** | **10,063,718.00** |

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා රජයේ ප්‍රතිපාදන හා අනෙකුත් ආදායම් පිළිබඳ විස්තරයක් පහත ප්‍රස්තාරය මඟින් දක්වා ඇත.



## 02. ප්‍රතිපත්ති සම්පාදනය

ආයුර්වේද වෛද්‍ය සභාව මගින් 2017 වර්ෂයේ පහත සඳහන් ස්ථාවර අනුකමිටු ක්‍රියාත්මක කරන ලදී.

- **විභාග පාලක මණ්ඩලය - ස්ථාවර අනු කමිටුව**
- **දණ්ඩනීය අවස්ථා පිළිබඳ කාරක සභාව - ස්ථාවර අනු කමිටුව**

### දණ්ඩනීය අවස්ථා පිළිබඳ කාරක සභාව - ස්ථාවර අනු කමිටුව

දණ්ඩණීය අවස්ථා පිළිබඳ කාරක සභාව 1961 අංක 31 දරණ පනතේ 10, 18 සහ 82 වගන්තිය ප්‍රකාර පනවා ඇති 1973 ආයුර්වේද (විනය) නියෝග වලට අනුගතව පිහිටුවා ඇති ස්ථාවර සභාවකි. එහිදී අනුගමනය කළ යුතු ව්‍යවස්ථානුගත ක්‍රියාවලිය 1973.01.04 දිනැතිව පළ කර ඇති අතර එය සාමාන්‍ය විනය පරීක්ෂණයට බෙහෙවින් සංකීර්ණ වූත් වගකීම් සහිත වූත් නෛතික විමර්ශන ක්‍රියාවලියකි. **2017 වර්ෂයේ දණ්ඩනීය අවස්ථා පිළිබඳ කාරක සභාව වෙත 14 දෙනකු යොමු කළ අතර ඉන් තිදෙනක් සම්බන්ධව පරීක්ෂණ කටයුතු ඉදිරියට පැවැත්වීමට තීරණය කර ඇත.**

### ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන්ගේ අතිරේක සුදුසුකම් නිර්ණය කිරීමේ අනුකමිටුව

1961 අංක 31 දරණ ආයුර්වේද පනතේ 62 වන වගන්තිය අනුව ලියාපදිංචි යම් ආයුර්වේද වෛද්‍යවරයෙකු හට තම ලියාපදිංචියෙන් පසුව ලබා ගන්නා වෘත්තියට අදාළ යම් සුදුසුකමක් අතිරේක සුදුසුකමක් ලෙස සභාව පිළිගත් විට එය නාම ලේඛනයට ඇතුළත් කිරීමේ බලය හිමිවේ. ඒ අනුව එම අතිරේක සුදුසුකම සඳහා සභාව විසින් නිකුත් කරනු ලබන සහතිකයක් දැරීමටත්, සිය නම සමඟ ප්‍රදර්ශනය කිරීමටත්, එම අතිරේක සුදුසුකම වෘත්තිය කටයුතු සඳහා භාවිතා කිරීමටත් නෛතික හිමිකම තහවුරු කරනු ලබයි. ආයුර්වේද වෛද්‍ය සභා තීරණය පරිදි මෙම වගන්තියේ විධිවිධාන අනුව අතිරේක සුදුසුකම් ලියාපදිංචි කිරීම ආරම්භ කර ඇති අතර මේ වන විට ඒ පිළිබඳව අදාළ පාර්ශවයන් දැනුම්වත් කර තිබේ. **2017 වර්ෂයේ දී වෛද්‍යවරුන් දෙදෙනකු සඳහා අතිරේක සුදුසුකම් සහතික නිකුත් කිරීමට ආයුර්වේද වෛද්‍ය සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

| අයිතමය | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| අතිරේක සුදුසුකම් ඇතුළත් කොට සහතික නිකුත් කර ඇති සංඛ්‍යාව | 03 | 03 | 00 | 04 | 02 |

## 03. විමර්ශන කටයුතු

ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන්ගේ වෘත්තය විෂමාචාර මෙන්ම ලියාපදිංචි නොවූ ආයුර්වේද වෛද්‍යවරුන් ලෙස පෙනී සිටින තැනැත්තන් සම්බන්ධයෙන් කරනු ලබන පැමිණිලි සොයා බලා අවශ්‍ය නීතිමය කටයුතු සිදු කිරීම සඳහා ආයුර්වේද වෛද්‍ය සභාවේ මහජන පැමිණිලි විමර්ශන ඒකකයක් පිහිටුවා ඇත. එම වෛද්‍යවරුන් විසින් සිදු කරනු ලබන අක්‍රමිකතා වෘත්තය විෂමාචාර ආයුර්වේද ආචාරධර්ම

වලට පටහැනිව ක්‍රියා කිරීම ආදිය විමර්ශනය මෙහි මූලික අරමුණයි. සභාවේ මෙම කාර්යය පුවත්පත් දැන්වීම් පැමිණිලි හා මහජන පැමිණිලි වශයෙන් වෙන්කොට විමර්ශනය සඳහා යොදා ගන්නා ලද.

| අයිතමය | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| විමර්ශනය කර ඇති පැමිණිලි සංඛ්‍යාව | 14 | 39 | 40 | 37 | 29 |

## 04. විශේෂ වෛද්‍ය මණ්ඩලය

රජයේ හා පෞද්ගලික ආයතන වල සේවයේ නියුතු සේවකයින් සඳහා ආයුර්වේද වෛද්‍යවරුන් විසින් නිකුත් කරනු ලබන වෛද්‍ය සහතික සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ xxvi වන පරිච්ඡේදයේ 4 වන වගන්තිය අනුව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් පවත්වනු ලබන වෛද්‍ය මණ්ඩලයට සමගාමීව ආයුර්වේද වෛද්‍ය සහතික සම්බන්ධයෙන් අදාළ විශේෂ වෛද්‍ය මණ්ඩල පවත්වනු ලැබේ. ඒ පිළිබඳව සොයා බැලීම සඳහා ඒ ආයතන මඟින් වෛද්‍ය සභාවට පොදු 142 ආකෘති පත්‍රය සම්පූර්ණ කර එවනු ලැබේ.

| අයිතමය | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| පවත්වා ඇති විශේෂ වෛද්‍ය මණ්ඩල සංඛ්‍යාව | 04 | 04 | 03 | 02 | 02 |

## 05. පනතේ 55 (1) හා 55 (2) වගන්ති යටතේ ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම

ආයුර්වේද වෛද්‍ය සභාව පහත සඳහන් මූලික ප්‍රතිපත්ති මත වෛද්‍යවරු ලියාපදිංචිය සිදු කරයි.


- ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන් අභිඥාණපත්‍රධාරීන් සහ රජය පිළිගත් සහතික පත්‍රධාරීන් සුදුසුකම් අනුව ලියාපදිංචි කිරීම.
- ආයුර්වේද වෛද්‍ය සභාව සම්මත කරනු ලැබූ ව්‍යවස්ථාව අනුව සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල හා නිර්දේශ අනුව සුදුසුකම්ලත් පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම

සම්මුඛ පරීක්ෂණයේ දී අපේක්ෂකයා ලබා ගන්නා ලකුණු ප්‍රමාණය අනුව ශ්‍රේණිගත කිරීමක් සිදුකරන අතර පරීක්ෂණයෙන් අසමත් වන අයැදුම්කරුවන් ඔවුන්ගේ ලකුණු ප්‍රමාණය අනුව මාස තුනක, මාස හයක හා වසරක් ආදී වශයෙන් ඇගැයුම් කාලයකට යටත් කොට නැවත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

2017 වර්ෂය අවසන් වන විට ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන් සංඛ්‍යාව 24825කි. මෙම වර්ෂය තුළ ආයුර්වේද වෛද්‍යවරුන් 124 දෙනෙකු පහත සඳහන් අංශ අනුව ලියාපදිංචි කර ඇත.

## 2013 සිට 2017 දක්වා පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම සඳහා සභාව මගින් පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සටහන

| අයිතමය | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| වාර්ෂිකව පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සංඛ්‍යාව | 29 | 31 | 21 | 21 | 19 |
| වාර්ෂිකව සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවූ අයැදුම්කරුවන් සංඛ්‍යාව | 461 | 362 | 210 | 239 | 272 |
| වාර්ෂිකව සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගී වූ අයැදුම්කරුවන් සංඛ්‍යාව | 355 | 296 | 165 | 187 | 215 |
| සම්මුඛ පරීක්ෂණ මගින් ලියාපදිංචිය සඳහා සුදුසුකම් ලැබූ අයැදුම්කරුවන් සංඛ්‍යාව | 182 | 221 | 111 | 100 | 42 |
| **සහභාගී වූ අයැදුම්කරුවන්ගෙන් සමත් වීමේ ප්‍රතිශතය** | 51.27% | 74.66% | 67.27% | 53.48% | 19.53% |



## 2013 සිට 2017 දක්වා ආයුර්වේද වෛද්‍ය සභාවේ වාර්ෂික ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සංඛ්‍යාව

| අයිතමය | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| **සාමාන්‍ය (සර්වාංග)** | | | | | |
| **උපාධිධාරීන්** | 137 | 132 | 148 | 234 | 70 |
| ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය කොළඹ විශ්ව විද්‍යාලය | 67 | 71 | 46 | 80 | 41 |
| ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය කැළණිය විශ්ව විද්‍යාලය | 47 | 30 | 35 | 72 | 17 |
| යුනානි වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය කොළඹ විශ්ව විද්‍යාලය | 17 | 16 | 21 | 18 | 12 |
| සිද්ධ වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය යාපනය විශ්ව විද්‍යාලය | 06 | 12 | 46 | 63 | - |
| ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය ඉන්දියාව | - | 03 | - | 01 | - |
| **ඩිප්ලෝමාධාරීන්** | 76 | 54 | 33 | 02 | 36 |
| ඩීඒඑම්එස් දේශීය වෛද්‍ය විද්‍යායතනය කොළඹ | - | - | - | - | - |
| සිද්ධායුර්වේදකුලාභීන් - ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යායතනය | - | - | - | -- | - |
| ආයුර්වේද ශාස්ත්‍රී | 72 | 54 | 30 | 02 | 30 |
| යාපනය සිද්ධ විද්‍යාලයේ අවසාන වසර සමත් | 04 | | 03 | - | 06 |
| **පාරම්පරික සර්වාංග** | 45 | 86 | 30 | 32 | 06 |
| පාරම්පරික | 45 | 86 | 30 | 32 | 06 |
| **පාරම්පරික විශේෂ** | 90 | 178 | 38 | 142 | 12 |
| සර්ප විෂ | 26 | 49 | 20 | 35 | 02 |
| කැඩුම් බිඳුම් | 47 | 92 | 15 | 87 | 10 |
| අක්ෂි රෝග | 01 | 5 | 2 | 03 | - |
| චර්ම රෝග | 07 | 7 | 1 | 03 | - |
| ගෙඩිවණ | 04 | 8 | - | 07 | - |
| ජලභීතිකා | 01 | 2 | - | 02 | - |
| දූවුම් පිළිස්සුම් | 02 | 1 | - | 02 | - |
| මානසික | 02 | 9 | - | 03 | - |
| හස්ති වෙදකම | - | 5 | - | - | - |
| **මුළු එකතුව ( සර්වාංග / විශේෂ )** | 348 | 450 | 249 | 410 | 124 |

2017.12.31 දිනට ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි මුළු වෛද්‍යවරුන් සංඛ්‍යාව


| අයිතමය | 2017.12.31 දින වන විට ලියාපදිංචි මුළු සංඛ්‍යාව |
|---|---|
| **සාමාන්‍ය (සර්වාංග)** | |
| **උපාධිධාරීන්** | **2604** |
| ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය කොළඹ විශ්ව විද්‍යාලය | 1340 |
| ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය කැළණිය විශ්ව විද්‍යාලය | 537 |
| යුනානි වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය කොළඹ විශ්ව විද්‍යාලය | 363 |
| සිද්ධ වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය යාපනය විශ්ව විද්‍යාලය | 355 |
| ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය ඉන්දියාව | 09 |
| **ඩිප්ලෝමාධාරීන්** | **5535** |
| එල්.ඒ.එම්.එස්. කල්කටා | 92 |
| එෆ්.එම්.බී.එස්. අලහමාබාද් | 04 |
| ඩී.අයි.එම්.එස්.දේශීය වෛද්‍ය විද්‍යායතනය කොළඹ | 520 |
| ඩී.ඒ.එම්.එස්. දේශීය වෛද්‍ය විද්‍යායතනය කොළඹ | 1298 |
| ඩී.එස්.ඒ.සී. - ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යායතනය | 1134 |
| ඩී.ඒ.එස්.සී. - ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යායතනය | 137 |
| එල්.ඒ.එම් යාපනය සිද්ධ විද්‍යාලය | 86 |
| සිද්ධායුර්වේදශුලාභීන් - ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යායතනය | 635 |
| ආයුර්වේද ශාස්ත්‍රී | 1414 |
| යාපනය සිද්ධ විද්‍යාලයේ අවසාන වසර සමත් | 215 |
| **පාරම්පරික සර්වාංග** | **6159** |
| පාරම්පරික | 6159 |
| **පාරම්පරික විශේෂ** | **8908** |
| සර්ප විෂ | 3721 |
| කැඩුම් බිඳුම් | 2511 |
| අක්ෂි රෝග | 636 |
| චර්ම රෝග | 351 |
| ගෙඩිවණ | 630 |
| ජලභීතිකා | 204 |
| දූවුම් පිළිස්සුම් | 84 |
| මානසික | 182 |
| විදුම් පිළිස්සුම් | 08 |
| වෙනත් | 571 |
| **එකතුව ( සර්වාංග / විශේෂ )** | **23206** |
| **තොරතුරු සොයා ගත නොහැකි** | **1619** |
| **මුළු එකතුව (සර්වාංග / විශේෂ / මියගොස් ඇති වෛද්‍යවරුන්)** | **24825** |
| **මියගොස් ඇති සංඛ්‍යාව** | **3095** |

## 06. ආයුර්වේද සාත්තු සේවකයින් හා භෛෂජ්‍යකවරුන් ලියාපදිංචි කිරීම

| අයිතමය | 2013.12.31 ලියාපදිංචි මුළු සංඛ්‍යාව | 2014 ලියාපදිංචි කර ඇති සංඛ්‍යාව | 2015 ලියාපදිංචි කර ඇති සංඛ්‍යාව | 2016 ලියාපදිංචි කර ඇති සංඛ්‍යාව | 2017 ලියාපදිංචි කර ඇති සංඛ්‍යාව | ලියාපදිංචි මුළු සංඛ්‍යාවබ |
|---|---|---|---|---|---|---|
| ආයුර්වේද සාත්තු සේවකයින් - හෙද නිලධාරීන් | 30 | -- | -- | -- | -- | 30 |
| භෛෂජ්‍යයකවරුන් | 192 | 20 | 04 | 32 | 00 | 248 |

## 07. ආයුර්වේද වෛද්‍ය සභාවේ නිල වෙබ් අඩවිය

රාජ්‍ය අංශයේ මෙන්ම ව්‍යාපාරික අංශයේ ප්‍රජාවගේ ආයුර්වේද වෛද්‍යවරුන් සම්බන්ධ විශේෂ අවධානය යොමු වී ඇති මෙම කාලසීමාවේ එම කටයුතු පහසු කිරීම සඳහා සහ ආයුර්වේද ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා හා ලියාපදිංචි හා ලියාපදිංචි අපේක්ෂිත ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා අවශ්‍යවන මාර්ගෝපදේශ, නීති රෙගුලාසි හා අනෙකුත් නෛතික තත්තවයන් රාජ්‍ය අංශයේ මෙන්ම ව්‍යාපාරික අංශයේ ප්‍රජාවගේ අවශ්‍යතාවය අනුව එළිදැක්වීම මෙම වෙබ් අඩවියෙන් අපේක්ෂා කෙරේ. ලියාපදිංචි සියළු වෛද්‍යවරුන්ගෙ තොරතුරු www.ayurvedicmedicoun.gov.lk නිල වෙබ් අඩවිය හරහා අන්තර්ජාලයට එක් කර ඇත.



## 08. 2017 වර්ෂය තුළ ආයුර්වේද වෛද්‍ය සභාව මඟින් ගනු ලැබූ හා ගෙන තිබූ තීරණවලට අනුගතව ක්‍රියාත්මක කරනු ලැබූ වෙනත් කටයුතු

1. 1961 අංක 31 දරණ ආයුර්වේද පනතේ 81 වගන්තිය ප්‍රකාරව උප්පැන්න මරණ රෙජිස්ට්‍රාර්වරුන් විසින් මියගොස් ඇති බව දන්වා එවා ඇති වෛද්‍යවරුන් ලියාපදිංචි නාමලේඛනයෙන් ඉවත් කිරීම

| අයිතමය | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| මියගොස් ඇති බව දන්වා එවා ඇති වෛද්‍යවරුන් සංඛ්‍යාව | 100 | 67 | 32 | 35 | 23 |

2. රජයේ හා පෞද්ගලික ආයතන වල සේවයේ නියුතු නිලධාරීන් සඳහා ආයුර්වේද වෛද්‍යවරුන් විසින් ලබා දෙනු ලැබූ වෛද්‍ය සහතික තහවුරු කිරීම් සිදුකිරීම.

| අයිතමය | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| වෛද්‍ය සහතික තහවුරු කිරීම් සිදු කළ සංඛ්‍යාව | 280 | 1057 | 1365 | 1080 | 738 |

එක් එක් රාජ්‍ය ආයතන වල විගණන විමර්ශන වලින් සපයා ඇති දත්ත අනුව සාවද්‍ය වෛද්‍ය සහතික නිකුත් කරන සැක සහිත වෛද්‍යවරුන් වෙත දින 14 ක් ඇතුළත ආයුර්වේද වෛද්‍ය සභාවට පැමිණ කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වා ලිපි යොමු කරනු ලැබේ. ඒ සඳහා ප්‍රතිචාර නොදක්වූ වෛද්‍යවරුන් විසින් නිකුත් කරන වෛද්‍ය සහතික පිළිනොගැනීමට කටයුතු කර ඒ බව අදාළ ආයතන දැනුම්වත් කිරීමට කටයුතු කරනු ලැබේ. එමඟින් සාවද්‍ය ලෙස නිකුත් කරනු ලබන වෛද්‍ය සහතික අවම කර ගැනීමට හැකි වී ඇත.

3. ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා හැඳුනුම්පත් නිකුත් කර ඇත.

| අයිතමය | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම | 495 | 539 | 286 | 716 | 227 |

4. ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා වාහන නිල ලාංඡන නිකුත් කිරීම.

| අයිතමය | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| වාහන නිල ලාංඡන නිකුත් කිරීම | 161 | 161 | 101 | 170 | 76 |

5. දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ සහයෝගය ඇතිව නවක ලියාපදිංචි වෛද්‍යවරුන් සඳහා මූලික වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

| අයිතමය | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| සහභාගිත්වය | 136 | 270 | 112 | 100 | 100 |

6. ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා වෛද්‍ය සහතික පොත් නිකුත් කිරීම.

| අයිතමය | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| නිකුත් කළ වෛද්‍ය සහතික පොත් සංඛ්‍යාව | 840 | 1063 | 1043 | 1405 | 1054 |

7. ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා ජාත්‍යන්තර සහතික නිකුත් කිරීම.

| අයිතමය | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| නිකුත් කළ ජාත්‍යන්තර සහතික සංඛ්‍යාව | 13 | 11 | 09 | 42 | 13 |

ඉහත කරුණු අනුව ආයුර්වේද වෛද්‍ය සභාව 2017 වර්ෂය තුළ එහි පරමාර්ථ ඉටුවන අයුරින් කටයුතු කර ඇති බව සඳහන් කිරීමට කැමැත්තෙමි. වෛද්‍ය සභාවේ පාලනයෙන් තොර හේතු මත ආයුර්වේදය උගන්වන ආයතන ලියාපදිංචි කිරීම වැනි අනෙකුත් අරමුණු ඉටු කිරීමට නොහැකි වූ බවත් එම අරමුණු 2018 වර්ෂයේ දී ඉටු කර ගැනීමට හැකි ලෙස මූලික කටයුතු ආරම්භ කර ඇති බවත් සඳහන් කරමි.

**එස්. කේ. කුලතුංගමුදලි**
**ආයුර්වේද කොමසාරිස් සහ**
**ආයුර්වේද වෛද්‍ය සභාවේ සභාපති**



2017.05.31 දින

මහරගම,
නාවින්න,
පරණ කොට්ටාව පාරේ,
ආයුර්වේද වෛද්‍ය සභා කාර්යාලයේ දී.

## ආයුර්වේද වෛද්‍ය සභාව

### 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| විස්තරය | 2017.12.31 | 2016.12.31 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| 01. අයභාරය - රජයේ ප්‍රතිපාදන | 6,000,000.00 | 5,250,000.00 |
| 02.වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ ගාස්තු - සටහන් 01 | 3,722,699.00 | 7,541,830.00 |
| 03.වෙනත් ආදායම් - සටහන් 02 | 341,019.00 | 315,018.00 |
| | | |
| **04. මුළු ආදායම ( 01 + 02 +03 )** | 10,063,718.00 | 13,106,848.00 |
| | | |
| 05.සාමාන්‍ය පොදු වියදම් - සටහන් 03 | 10,094,268.00 | 10,287,291.00 |
| 06.මූල්‍ය වියදම් - සටහන් 04 | 159,909.00 | 129,909.00 |
| 07.වෙනත් වියදම් - සටහන් 05 | 1,286,445.00 | 1,536,289.00 |
| | | |
| **08. මුළු වියදම ( 05 + 06 + 07)** | 11,540,622.00 | 11,953,489.00 |
| **09. වාර්ෂික ඌණතාවය / අතිරික්තය ( 04 - 08 )** | (1,476,904.00) | 1,153,359.00 |

**ඉහත සකස් කරන ලද ගිණුම් කරන ප්‍රකාශණය නිවැරදිව හා ඊට අදාල ගිණුම් තැබීම නිවැරදිව සිදු කර ඇති බව සහතික කරමි.**

වී.වෛද්‍ය බී.ඩබ්. පද්මශාන්ති වික්‍රමරත්න
ලේඛකාධිකාරී
ආයුර්වේද වෛද්‍ය සභාව

එස්.කේ. කුලතුංගමුදලි
සභාපති, (රාජකාරී ඉටු කරන)
ආයුර්වේද වෛද්‍ය සභාව

සකස් කලේ -
දමිත් කළුආරච්චි
කළමනාකරණ සහකාර
ආයුර්වේද වෛද්‍ය සභාව

සටහන් 01

| විස්තරය | 2017.12.31 | 2016.12.31 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| ලියාපදිංචි ගාස්තු | 728,500.00 | 1,824,000.00 |
| සම්මුඛ පරීක්ෂණ ගාස්තු | 155,600.00 | 182,800.00 |
| ලියාපදිංචි ඉල්ලුම්පත්‍ර ගාස්තු | 789,950.00 | 1,468,950.00 |
| ලිඛිත පරීක්ෂණ ගාස්තු | - | 506,250.00 |
| වාහන ලාංඡන නිකුත් කිරීමේ ගාස්තු | 76,000.00 | 169,000.00 |
| සහතික පිටපත් ගාස්තු | 55,000.00 | 111,750.00 |
| තැපැල් ආදායම් | 34,071.00 | 71,970.00 |
| වෛද්‍ය සහතික පොත් ගාස්තු | 318,308.00 | 424,610.00 |
| වෛද්‍ය හැඳුනුම්පත් ගාස්තු | 268,750.00 | 777,500.00 |
| නම් වෙනස් කිරීමේ ගාස්තු | 22,500.00 | 62,500.00 |
| විශේෂ වෛද්‍ය මණ්ඩල ගාස්තු | 72,000.00 | |
| ලියාපදිංචි අංකය තහවුරු කිරීමේ ගාස්තු | 26,600.00 | |
| අතිරේක සුදුසුකම් ඇතුළත් කිරීමේ ගාස්තු | 11,600.00 | 5,900.00 |
| ජාත්‍යන්තර සහතික පිටපත් ගාස්තු | 130,000.00 | 420,000.00 |
| වෛද්‍ය සහතික සහතික කිරීම | 100,000.00 | 162,300.00 |
| ලියාපදිංචිය නැවත අලුත් කිරීම | 933,820.00 | 1,354,300.00 |
| | 3,722,699.00 | 7,541,830.00 |

සටහන් 02

| විස්තරය | 2017.12.31 | 2016.12.31 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| සේවක ණය පොළී | 69,354.00 | 50,941.00 |
| පාරිතෝෂික ආයෝජන පොළිය | 257,734.00 | 163,305.00 |
| විවිධ ආදායම් | 13,931.00 | 100,772.00 |
| | 341,019.00 | 315,018.00 |

සටහන් 03

| විස්තරය | 2017.12.31 | 2016.12.31 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| කාර්ය මණ්ඩල වැටුප් | 4,880,028.00 | 4,753,802.00 |
| දිරි දීමනා | 290,850.00 | 372,150.00 |
| ගණකාධිකාරී දීමනා | 90,000.00 | 90,000.00 |
| ලේඛකාධිකාරී දීමනා | 138,544.00 | 61,575.00 |
| සේවක අර්ථ සාධක අරමුදල | 682,661.00 | 558,387.00 |
| සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල | 146,196.00 | 139,597.00 |
| වෛද්‍ය හැඳුනුම්පත් ගාස්තු | 43,618.00 | 125,824.00 |
| ලිපිද්‍රව්‍ය වියදම් | 345,405.00 | 270,227.00 |
| සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ගාස්තු | 204,150.00 | 266,450.00 |
| වෛද්‍ය සභා රැස්වීම් ගාස්තු | 885,000.00 | 847,400.00 |
| අතිකාල වියදම් | 660,845.00 | 507,351.00 |
| දුම්රිය අනුග්‍රහ වාර ප්‍රවේශපත්‍ර | 39,480.00 | 39,480.00 |
| අනු කමිටු දීමනා | 228,600.00 | 161,300.00 |
| දුරකතන ගාස්තු | 133,929.00 | 114,559.00 |
| දුම්රිය බලපත්‍ර ගාස්තු | 3,960.00 | 1,200.00 |
| පාරිතෝෂික දීමනා | 292,138.00 | 98,433.00 |
| මුද්‍රණ ගාස්තු | 171,613.00 | 116,329.00 |
| දැන්වීම් ගාස්තු | 52,325.00 | 33,300.00 |
| ලිඛිත පරීක්ෂණ ගාස්තු | 259,150.00 | 478,487.00 |
| කුළිරථ ගාස්තු | 73,890.00 | 689,644.00 |
| ජලබිල්පත් | 31,850.00 | 33,775.00 |

| | | |
|---|---|---|
| සේවක පුහුණු ගාස්තු | - | 17,000.00 |
| වෘත්තීය සංවර්ධන වැඩසටහන් | 50,000.00 | 95,951.00 |
| විදුලි ගාස්තු | 390,036.00 | 415,070.00 |
| | 10,094,268.00 | 10,287,291.00 |

සටහන් 04

| විස්තරය | 2017.12.31 | 2016.12.31 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| විගණන ගාස්තු | 150,000.00 | 120,000.00 |
| රක්ෂණ ගාස්තු | 9,909.00 | 9,909.00 |
| | 159,909.00 | 129,909.00 |

සටහන් 05

| විස්තරය | 2017.12.31 | 2016.12.31 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| විවිධ වියදම් | 323,552.00 | 165,197.00 |
| ගමන් වියදම් | 218.00 | 79,814.00 |
| තැපැල් ගාස්තු | 137,586.00 | 186,910.00 |
| සංග්‍රහ වියදම් | 141,210.00 | 243,426.00 |
| පුවත්පත් ගාස්තු | 34,240.00 | 30,475.00 |
| කාර්යාල උපකරණ අළුත්වැඩියා | 205,055.00 | 318,365.00 |
| වාර්ෂික ක්ෂය කිරීම් | 442,993.00 | 512,102.00 |
| බොල් ණය කපා හැරීමේ ගිණුම | 1,591.00 | |
| | 1,286,445.00 | 1,536,289.00 |

# ආයුර්වේද වෛද්‍ය සභාව

## 2017.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | 2017.12.31 රුපියල් | | 2016.12.31 රුපියල් | |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම වත්කම්** | | | | |
| මුදල් ශේෂය | 4,339,576.00 | | 5,406,214.00 | |
| කාර්යමණ්ඩල ණය | 1,906,540.00 | | 1,357,811.00 | |
| වෛද්‍ය සහතික පොත් තොග ගිණුම | 260,880.00 | | 311,472.00 | |
| ලිපිද්‍රව්‍ය තොගය | 379,684.00 | | 157,068.00 | |
| තැපැල් මුද්දර තොගය | 132,820.00 | | 144,005.00 | |
| ඉදිරියට ගෙවන ලද කාර්යාල උපකරණ | 53,806.00 | | 29,386.00 | |
| | | **7,073,306.00** | | **7,405,956.00** |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපල, පිරියත හා උපකරණ ( ගත්මිල ) | 6,168,201.00 | | 5,936,355.00 | |
| සමුච්චිත ක්ෂය | 4,012,204.00 | | 3,569,211.00 | |
| දේපල, පිරියත හා උපකරණ (ශුද්ධ අගය) | | **2,155,997.00** | | **2,367,144.00** |
| **වෙනත් මූල්‍ය නොවන වත්කම්** | | | | |
| පාරිතෝෂික දීමනා ආයෝජන | | **2,838,917.00** | | **2,546,779.00** |
| **මුළු වත්කම්** | | **12,068,220.00** | | **12,319,879.00** |
| **බැරකම්** | | | | |
| **ජංගම බැරකම්** | | | | |
| විගණන ගාස්තු | 226,725.00 | | 420,000.00 | |
| දුරකතන ගාස්තු | 11,463.00 | | 9,868.00 | |
| පුවත්පත් ගාස්තු | 2,840.00 | | 2,615.00 | |
| අතිකාල දීමනා | 57,438.00 | | 31,855.00 | |
| තැපැල් ගාස්තු | 5,900.00 | | 3,100.00 | |
| උපචිත කුලී රථ | 6,080.00 | | | |
| ඉදිරියට ගෙවන ලද අයැදුම්පත් ගාස්තු | 97,500.00 | | 46,500.00 | |
| විදුලි ගාස්තු | 13,442.00 | | 14,462.00 | |
| කාර්ය මණ්ඩල වැටුප් | 2,747.00 | | 1,437.00 | |
| ජල බිල්පත් | 2,275.00 | | 1,400.00 | |
| දිරි දීමනා | 30,800.00 | | 28,000.00 | |
| ඉදිරියට ගෙවන ලද හැඳුනුම්පත් ගාස්තු | 83,500.00 | | 41,250.00 | |
| ඉදිරියට ගෙවන ලද ලියාපදිංචි ගාස්තු | 149,000.00 | | 155,000.00 | |
| ඉදිරියට ගෙවන ලදඅතිරේක සුදුසුකම් ගාස්තු | 3,000.00 | | 8,600.00 | |

| | | | | |
|---|---|---|---|---|
| ඉදිරියට ගෙවන ලද සහතික පිටපත් ගාස්තු | 2,500.00 | | | |
| ඉදිරියට ගෙවන ලද ජා ස. ගාස්තු ගිණුම | 10,000.00 | | | |
| ඉදිරියට ගෙවන ලද ලිඛිත පරීක්ෂණ ගාස්තු | 241,800.00 | | | |
| ඉදිරියට ගෙවන වාහන ලාංජන | 2,500.00 | | 8,000.00 | |
| උපචිත මුද්‍රණ ගාස්තු | 22,425.00 | | | |
| | | 971,935.00 | | 772,087.00 |
| **ජංගම නොවන බැරකම්** | | | | |
| පාරිතෝෂික දීමනා වෙන්කිරීම | | 2,838,917.00 | | 2,546,779.00 |
| මුළු බැරකම් | | 3,810,852.00 | | 3,318,866.00 |
| **ශුද්ධ වත්කම්** | | 8,257,368.00 | | 9,001,013.00 |
| ශුද්ධ වත්කම් / ස්කන්ධය | | | | |
| ප්‍රාග්ධනය හා සංචිතය | 9,734,272.00 | | 7,847,654.00 | |
| සමුච්චිත ඌණතාවය / අතිරික්තය | (1,476,904.00) | | 1,153,359.00 | |
| | 8,257,368.00 | | 9,001,013.00 | |
| අඩු කළා / එකතු කළා | | - | | |
| **මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය** | | 8,257,368.00 | | 9,001,013.00 |

**ඉහත සකස් කරන ලද ගිණුම්කරණ ප්‍රකාශනය නිවැරදිව හා ඊට අදාල ගිණුම් තැබීම නිවැරදිව සිදු කර ඇති බව සහතික කරමි.**

වී.වෛද්‍ය බී.ඩබ්. පද්මශාන්ති වික්‍රමරත්න
ලේඛකාධිකාරී
ආයුර්වේද වෛද්‍ය සභාව

එස්.කේ. කුලතුංගමුදලි
සභාපති (රාජකාරි ඉටු කරන)
ආයුර්වේද වෛද්‍ය සභාව

සකස් කලේ,
කේ.ඒ. දමිත් කාර්‍යාරච්චි
කළමනාකරණ සහකාර
ආයුර්වේද වෛද්‍ය සභාව

# ආයුර්වේද වෛද්‍ය සභාව

## 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2017 වර්ෂය | | | 2016 වර්ෂය | | |
|---|---|---|---|---|---|---|
| | අඩුවීම | එකතුවීම | | අඩුවීම | එකතුවීම | |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ) ක්‍රියාකාරකම් වලින් ලද ආදායම | | | | | | |
| ‍ායමට පෙර අතිරික්තය | | | (1,476,903.00) | | | 1,153,359.0 |
| ල් චලනය කෙරෙහි බල නොපාන විෂයන් ගැලපීම | | | | | | |
| කාර්ය මණ්ඩල ණය පොලී | 69,354.00 | | | 50,941.00 | | |
| පාරිතෝෂික ආයෝජන පොළිය | 257,734.00 | | | 163,305.00 | | |
| වාර්ෂික ක්ෂය | | 442,993.00 | | | 512,102.00 | |
| සංචිත වෙනස්වීම | | 733,258.00 | | 712,624.00 | 590,821.00 | |
| විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | 292,138.00 | | | 98,433.00 | |
| | 327,088.00 | 1,025,396.00 | 698,308.00 | 926,870.00 | 1,201,356.00 | 274,486.0 |
| මහෙයුම් අතිරික්තය | | | (778,595.00) | | | 1,427,845.0 |
| ග්ධන විෂයන්ගේ වෙනස්වීම. | | | | | | |
| ණය ගැතියෝ | 548,729.00 | | | 90,020.00 | | |
| තොගය ( ලිපිද්‍රව්‍ය ) | 222,615.00 | | | | 66,584.00 | |
| තැපැල් මුද්දර තොගය | | 11,185.00 | | 93,090.00 | | |
| වෛද්‍ය සහතික පොත් තොග ගිණුම | | 50,592.00 | | | 67,440.00 | |
| විගණන ගාස්තු | 193,275.00 | | | | 120,000.00 | |
| උපචිත දුරකතන ගාස්තු | | 1,595.00 | | | 3,179.00 | |
| උපචිත විවිධ වියදම් | | | | | | |
| ඉදිරි වර්ෂය සඳහා ගෙවීම් කාර්යාල උපකරණ | 24,420.00 | | | 19,412.00 | | |
| උපචිත ජල ගාස්තුව | | 875.00 | | 1,225.00 | | |
| දැන්වීම් ගාස්තු | | | | | | |
| උපචිත අතිකාල ගාස්තු | | 25,583.00 | | | 10,029.00 | |
| උපචිත දුම්රිය බලපත්‍ර ගාස්තු | | | | 2,800.00 | | |
| උපචිත ලිඛිත පරීක්ෂණ ගාස්තු | | 241,800.00 | | | | |
| උපචිත දිරි දීමනා | | 2,800.00 | | | 2,800.00 | |
| උපචිත කාර්ය මණ්ඩල වැටුප් | | 1,309.00 | | | 1,437.00 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| උපචිත හැදුනුම්පත් ගාස්තු | | | | | | |
| ඉදිරිවර්ෂය සඳහා ලි.ප.ගාස්තු | 6,000.00 | | | | 155,000.00 | |
| උපචිත විදුලි ගාස්තු | 1,020.00 | | | 3,807.00 | | |
| උපචිත මුද්‍රණ ගාස්තු ගිණුම | | 22,425.00 | | | | |
| වාහන ලාංජන ගිණුම | 5,500.00 | | | | 7,400.00 | |
| ඉදිරි වර්ෂය සඳහා අයැදුම්පත් ගාස්තුව | | 51,000.00 | | | 46,500.00 | |
| ඉදිරි වර්ෂය සඳහා හැදුනුම්පත් ගාස්තුව | | 42,250.00 | | | 41,250.00 | |
| ඉදිරි වර්ෂය සඳහා අතිරේක සුදුසුකම් | 5,600.00 | | | | 8,600.00 | |
| උපචිත පුවත්පත් ගාස්තු | | 225.00 | | | 2,615.00 | |
| ඉදිරි වර්ෂය සඳහා තැපැල් ගාස්තු | | 2,800.00 | | | 3,100.00 | |
| ඉදිරියට ගෙවන ලද සහතික පිටපත් ගාස්තු ගිණුම | | 2,500.00 | | | | |
| ඉදිරියට ගෙවන ලද ජාත්‍යන්තර ස.ගාස්තු ගිණුම | | 10,000.00 | | | | |
| උපචිත කුලීරථ ගාස්තු | | 6,080.00 | | 18,820.00 | | |
| | 1,007,159.00 | 473,019.00 | **(534,140.00)** | 229,174.00 | 535,934.00 | 306,760.00 |
| **ම ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | **(1,312,735.00)** | | | 1,734,605.00 |
| **ජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | | | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | 231,846.00 | 442,993.00 | | 756,193.00 | | |
| පාරිතෝෂික ආයෝජන පොළිය | | 257,734.00 | | | 163,305.00 | |
| පාරිතෝෂික දීමනා | 292,138.00 | | | 98,433.00 | | |
| | 523,984.00 | 700,727.00 | **176,743.00** | 854,626.00 | 163,305.00 | (691,321.00) |
| **සමාන විෂයන්ගේ අඩුවීම** | | | **(1,135,992.00)** | | | 1,043,284.00 |
| **ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | | | | |
| කාර්ය මණ්ඩල ණය පොලී | | | **69,354.00** | | | 50,941.00 |
| | | | **(1,066,638.00)** | | | 1,094,225.00 |
| **ආරම්භයේ මුදල් සහ මුදල් හා සමාන විෂයන්** | | | | | | |
| බැංකු ගිණුම | | | **5,406,214.00** | | | 4,311,989.00 |
| **අවසානයේ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | | **4,339,576.00** | | | 5,406,214.00 |
| **අවසානයේ මුදල් සහ මුදල් හා සමාන විෂයන්** | | | | | | |
| බැංකු ගිණුම | | | **4,339,576.00** | | | 5,406,214.00 |
| **වසානයේ මුදල් සහ මුදල් සමාන විෂයන්ගේ අඩුවීම** | | | **4,339,576.00** | | | 5,406,214.00 |

**කස් කරන ලද ගිණුම්කරණ ප්‍රකාශනය නිවැරදිව හා ඊට අදාල ගිණුම් තැබීම නිවැරදිව සිදු කර ඇති බව සහතික කරමි.**

ළේ :- **දමිත් කළුආරච්චි**

කරණ සහකාර - ආයුර්වේද වෛද්‍ය සභාව

මගේ අංකය / எனது இல. / My No. } එච්එස්එම්/සී/ඒඑම්සී/01/17/13 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2018 ජූලි 12 දින.

සභාපති
ආයුර්වේද වෛද්‍ය සභාව.

**ආයුර්වේද වෛද්‍ය සභාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 3 කොටසෙහි 11 සිට 21 දක්වා වගන්ති සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් වෛද්‍ය සභාවේ සභාපති වෙත 2018 ජුනි 22 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000–1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 . මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ආයුර්වේද වෛද්‍ය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1**

(i) ප්‍රමිතයේ 48 ඡේදය ප්‍රකාරව, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසරදී ඇති විටෙක හැර ආදායම් හා වියදම් හිලව් නොකළ යුතු නමුත්, රු.368,900 ක් වූ වෛද්‍ය සහතික පොත් 1054 ක අලෙවි ආදායමට එරෙහිව එම පොත්වල මුද්‍රණ වියදම වූ රු.50,592 ක් හිලව් කර රු.318,308 ක් වූ ශුද්ධ ආදායම පමණක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ii) ප්‍රමිතයේ 132 ඡේදය ප්‍රකාරව, සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවද, සභාව වෙත ලැබෙන රාජ්‍ය ප්‍රදාන ගිණුම්ගත කිරීමට අදාළ ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7**

ප්‍රමිතයේ 69 ඡේදය ප්‍රකාරව, වත්කමක ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීමට සූදානම් තත්ත්වයට ගෙන ආ පසු වුවත් ඊට පටහැනිව සභාව විසින් වත්කම මිලදීගත් දිනය නොසලකා සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කර තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී පරිගණක පද්ධතිය අළුත්වැඩියා කිරීම හා තිරරෙදි දැමීම වෙනුවෙන් ගෙවිය යුතු රු.113,570 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණු රජයේ ප්‍රදාන රු.6,750,000 කින් රු. 6,000,000 ක් පමණක් ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර රු.750,000 ක් සංචිත හා ප්‍රාග්ධන ගිණුමට බැර කර තිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ III වන කොටසේ II (1) (ඉ) වගන්තිය. | ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරු තිදෙනෙකු හා අනුමත කරනු ලැබූ එක් එක් ආයුර්වේද අධ්‍යාපනික ආයතනයක ආචාර්යවරුන් අතරින් තෝරා පත්කර ගනු ලැබූ එක් ආචාර්යවරයෙකු සභාවේ සාමාජිකයකු ලෙස පත් කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම සාමාජිකයින් පත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756 | මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2017 දෙසැම්බර් 31 දිනට රු.6,168,201 ක් වූ දේපල පිරියත හා උපකරණ පිළිබඳව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2018 මැයි 30 දින වන විටත් පවත්වා නොතිබුණු අතර ඉකුත් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් පෙන්වාදී තිබුණු නිර්දේශයන් 2018 මැයි 10 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 වගන්තිය. | වෛද්‍ය සභාවේ ඉහළ කළමනාකරණ මට්ටමේ තනතුරක් වන ලේඛකාධිකාරී තනතුරට අවශ්‍ය බඳවාගැනීමේ පරිපාටියක් පිළියෙල කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ඈ) | 2005 ජූලි 05 දිනැති අංක 14/13/08 (03) දරන ආයුර්වේද වෛද්‍ය සභා පත්‍රිකාව | සභාවේ ලියාපදිංචි සියළුම වෛද්‍යවරුන් වර්ෂ 05 කට වරක් ලියාපදිංචිය යාවත්කාලීන කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලියාපදිංචිය වර්ෂ 05 ඉක්ම වූ වෛද්‍යවරු 15,727 ක් ලියාපදිංචිය අළුත්කර නොතිබුණු අතර ලියාපදිංචිය යාවත්කාලීන කිරීම සඳහා සභාව විසින් විධිමත් ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබුණි. තවද ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළව සභාවට අහිමිව තිබුණු ආදායම රු.16,530,750 ක් විය. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,476,904 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,153,359 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,630,263 ක පිරිහීමක් දක්නට ලැබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව වෛද්‍යවරු ලියපදිංචි කිරීමේ ගාස්තු සියයට 50 කින් හෙවත් රු.3,819,131 කින් අඩුවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු.1,575,270 ක් වූ අතිරික්තය 2014 වර්ෂයේදී රු.3,371,292 දක්වා වැඩිවී තිබුණු අතර 2015 වර්ෂයේදී රු.712,624 ක් දක්වා නැවත අඩුවී තිබුණි. 2016 වර්ෂයේදී රු.1,153,359 ක් දක්වා වැඩිවී තිබුණු අතිරික්තය 2017 වර්ෂයේදී රු.1,476,904 ක ඌනතාවයක් දක්වා අඩු වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සහ බදු නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදී රු.5,733,505 ක් වූ දායකත්වය උච්චාවචනයන් සහිතව 2017 වර්ෂය වන විට රු.4,674,974 ක් දක්වා අඩුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයුර්වේද වෛද්‍ය සභාවේ වෛද්‍යවරු හා පාරම්පරික වෛද්‍යවරු ලියාපදිංචි කිරීම, විභාග පැවැත්වීම, විභාග ප්‍රතිඵල නිකුත් කිරීම යනාදී වශයෙන් වූ ක්‍රියාවලීන්හි කාර්යයන් ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා කාර්යසාධනය සමාලෝචනය කර නොතිබුණි.

(ආ) 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 03 කොටසෙහි 18 වගන්තිය ප්‍රකාරව සභාවේ අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළදී වෛද්‍යවරුන් ලියාපදිංචි වීම සියයට 70 ක ප්‍රතිශතයකින් අඩුවී තිබුණු අතර උපාධිධාරී, පාරම්පරික සර්වාංග හා පාරම්පරික විශේෂ වෛද්‍යවරු ලියාපදිංචිය පිළිවෙලින් සියයට 70 කින් සියයට 81 කින් හා සියයට 91 කින් අඩුවී තිබුණු නමුත් ඊට හේතුවූ කරුණු අනාවරණය නොකෙරුණි.

(ii) ආයුර්වේද සාත්තු සේවකයින් (හෙද නිළධාරීන්) අවසන් වරට 2013 වර්ෂයේදී ලියාපදිංචි කිරීමෙන් පසු අලුතින් ලියාපදිංචි කර නොතිබුණි. තවද ආයුර්වේද ඖෂධ සංයෝජකයින් සමාලෝචිත වර්ෂයේදී ලියාපදිංචි කර නොතිබුණු අතර එම නිලධාරීන් සභාවේ ලියාපදිංචි කරවීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය තුළදී පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ ලිඛිත පරීක්ෂණය පැවැත්විය යුතු වුවත්, එම විභාගය 2018 මැයි 10 දින විටත් පවත්වා නොතිබුණි. තවද, ඉකුත් වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී පවත්වා තිබුණු ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල 2017 දෙසැම්බර් 31 දින වන විටත් නිකුත් කිරීමට සභාව අපොහොසත් වී තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂය තුළදී හා ඉකුත් වර්ෂයේදී ව්‍යාජ වෛද්‍යවරුන් සම්බන්ධ පිළිවෙලින් පැමිණිලි 14 ක් හා පැමිණිලි 34 ක් ලැබී තිබුණි. ඉන් පිළිවෙලින් පැමිණිලි 11 ක හා 08 ක විමර්ශන කටයුතු 2018 මැයි 16 දින වන විටත් අවසන් කර නොතිබුණු අතර විමර්ෂන කටයුතු අවසන් කර තිබුණු පිළිවෙලින් පැමිණිලි 03 කට හා 26 කට අදාළව පසු විපරම් කිරීමක් සිදුකර නොතිබුණි. ආයුර්වේද පනත හා විනය නියෝග කාලීන අවශ්‍යතාවය පරිදි සංශෝධනය කර නොතිබුණු බැවින් විමර්ශනය කළ බොහෝ පැමිණිලි අවවාද හා උපදෙස් ලබාදීම්වලට පමණක් සීමාවී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉටුකළ යුතු උපාය මාර්ග 12 කට අදාළ ක්‍රියාකාරකම් 26 ක් සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කිරීමට අපොහොසත් වී තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයුර්වේද වෛද්‍ය සභා ගොඩනැගිල්ලට විදුලි සැපයුම සිදු කරන විදුලි මීටරය සම්බන්ධ කරමින් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ රියදුරු නේවාසිකාගාරය වෙත විදුලි සැපයුම ලබාදීම හේතුවෙන් ආයුර්වේද වෛද්‍ය සභාවේ සාමාන්‍ය මාසික විදුලි බිල රු.32,503 ක් දක්වා අසාමාන්‍ය අයුරින් වැඩිවී තිබුණි.

(ආ) සභාවේ ලේඛකාධිකාරී තනතුර සඳහා 2017 අගෝස්තු 08 දින සිට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණු ආයුර්වේද විශේෂඥ වෛද්‍යවරිය වෙත නිකුත් කර තිබුණු පත්වීම් ලිපිය ප්‍රකාරව ඇය සභාවේ පූර්ණකාලීනව සේවය කළ යුතු වුවද, ඇයගේ සේවයට පැමිණීම හා පිටවීම අදාළ ලේඛනයේ සටහන් තැබීම අවශ්‍ය නොවන බවට සභාව විසින් තීරණය කර තිබුණු බැවින් ඇය එම තනතුරේ පූර්ණකාලීනව රැඳී නොසිටින බව නිරීක්ෂණය විය.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට සභාවේ ලියාපදිංචිව සිටින වෛද්‍යවරුන්ගෙන් තොරතුරු සොයාගත නොහැකි වූ වෛද්‍යවරු 1619 දෙනෙකු පිළිබඳව සභාව අප්‍රමාදව කටයුතු නොකිරීම නිසා එම ලියාපදිංචි අංක භාවිතාකර ව්‍යාජ වෛද්‍යවරු කර්මාන්තයේ නියැලීමට ඉඩකඩ පවතින බව නිරීක්ෂණය විය.

### 4.3 අරමුදල් කළමනාකරණය

2017 ජනවාරි 01 දිනට මුදල් පොතට අනුව බැංකු ජංගම ගිණුමේ ශේෂය රු.5,406,214 ක් වූ අතර 2017 දෙසැම්බර් 31 දින වන විට එම ශේෂය රු.4,339,576 ක් විය. සමාලෝචිත වර්ෂයේ මාසික සාමාන්‍ය බැංකු ශේෂය රු.4,992,668 ක්ව පැවති බැවින්ද 2017 දෙසැම්බර් 31 දිනට ජංගම අනුපාතය 7.27 ක් වූ බැවින්ද කාරක ප්‍රාග්ධන අවශ්‍යතා හැර ඉතිරි මුදල් පොලී ආදායම් ලැබෙන කෙටිකාලීන ආයෝජනවල තැන්පත් කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

### 4.4 මෙහෙයුම් ක්‍රියාකාරකම්

ආයුර්වේද වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය යාවත්කාලීන කිරීමේදී නව සහතිකයක් නිකුත් කිරීමටත්, එම සහතික පත් 6,000 ක් මුද්‍රණය කිරීමටත් 2015 දෙසැම්බර් 18 දින පාලක සභාව තීරණය කර තිබුණි. නමුත් 2018 මැයි 10 දින වන විටත් නව සහතික පත් මුද්‍රණය කර ගැනීමට අපොහොසත්වී තිබුණු බැවින් 2015 සිට 2017 දක්වා වර්ෂවල ලියාපදිංචිය යාවත්කාලීන කරගැනීමට මුදල් ගෙවා තිබුණු වෛද්‍යවරු 7,934 ක් වෙත අදාළ ලියාපදිංචි සහතික නිකුත් කිරීමට නොහැකි වී තිබුණි.

### 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

සභාවේ අනුමත කාර්ය මණ්ඩලය ප්‍රකාරව, කළමනාකරණ සහකාරවරුන් දෙදෙනකුගේ හා කාර්යාල සහායකවරයකුගේ පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

## 5. තිරසර සංවර්ධනය

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතින්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව, සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින නමුත් සමාලෝචිත වර්ෂයට අදාළව ආයුර්වේද වෛද්‍ය සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, ව්‍යවස්ථාපිත මණ්ඩලවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන දින 41 ක ප්‍රමාදයක් සහිතව 2018 අප්‍රේල් 11 දින ඉදිරිපත් කර තිබුණි.

### 6.2 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම් අයිතම 12 ක අයවැයගත ආදායම හා තත්‍ය ආදායම අතර සියයට 45 සිට සියයට 100 දක්වා පරාසයක හා වියදම් අයිතම 03 ක අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර සියයට 29 සිට සියයට 128 දක්වා පරාසයක අවාසිදායක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

### 6.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව, සභාවේ 2015 හා 2016 වර්ෂයන්ට අදාළ වාර්ෂික වාර්තා 2018 මැයි 23 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 6.4 නොවිසඳී ඇති විගණන ඡේද

2006 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළදී ලැබී තිබුණු එකතුව රු.9,780 ක් වූ මුදල් ඇණවුම් 27 ක් උපලබ්ධි කර නොගෙන සේවා සපයා තිබුණු අතර එම මුදල් ඇණවුම් 27 හි මුල් පිටපත් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

7. **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| මෙහෙයුම් පාලනය | (i) පාරම්පරික වෛද්‍යවරු ලියාපදිංචි කිරීමේදී, අයදුම්පත් භාර ගැනීම, ලිඛිත හා වාචික පරීක්ෂණ පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම යන පියවරයන් සඳහා කාල වකවානු නිශ්චය කර ඒ අනුව කටයුතු නොකිරීම.<br><br>(ii) ආයුර්වේද පනත හා විනය නියෝග කාලීනව සංශෝධනය කර පැමිණිළි කඩිනමින් විමර්ශනය කළ හැකි පරිදි ක්‍රමවේදයක් ස්ථාපිත නොකිරීම. |

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)

## සංස්ථාපිත තොරතුරු

නම -ආයුර්වේද වෛද්‍ය සභාව

ව්‍යවස්ථාපිත තත්වය -

1927 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අනුකාරක සභා නිර්දේශය අනුව 1928 දී පිහිටවනු ලැබූ ස්වදේශීය වෛද්‍ය මණ්ඩලය ශ්‍රී ලාංකේය ආයුර්වේද ක්ෂේත්‍රයේ ප්‍රථම නෛතික අධිකාරී බලය ලත් ආයතනය විය. 1935 අංක 46 දරන ලංකායුර්වේද වෛද්‍යානුශාසක සභා ආඥා පනත මගින් ස්ථාපනය කරන ලද ආයුර්වේද වෛද්‍ය සභාව 1941 අංක 17 දරන ස්වදේශිය වෛද්‍ය ආඥා පනතේ (1945 අංක 49 හා 1949 අංක 49 මගින් සංශෝධිත) විධිවිධාන යටතේ නැවත ස්ථාපනය කරනු ලැබීය. දැනට ක්‍රියාත්මක ආයුර්වේද වෛද්‍ය සභාව 1961 අංක 31 දරණ ආයුර්වේද පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ ව්‍යවස්ථාපිත ආයතනයකි.

බැංකුකරුවෝ -

1. ලංකා බැංකුව, ( ප්‍රධාන බැංකුකරු )
   මහරගම

2. ජාතික ඉතිරි කිරීමේ බැංකුව,
   ඉතුරුම් නිවස,
   ප්‍රධාන කාර්යාලය,
   කොල්ලුපිටිය.

විගණකයින් -

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
නො.306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.


| | | | | | |
|---|---|---|---|---|---|
| සභාපති<br>தலைவர்<br>Chairman | 011-2847555 | ලේඛකාධිකාරී<br>பதிவாளர்<br>Registrar | 011-5672906<br>011-2746754 | කාර්යාලය<br>காரியாலயம்<br>Office | 011 -5672905<br>011 -2896911- 1<br>Ext. 315/316/321 |

Web site :- www.ayurvedicmedicoun.gov.lk E mail :- ayurmc@sltnet.lk

# ස්තූතිය

ගරු සෞඛ්‍ය , පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු සෞඛ්‍ය , පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා

ආයුර්වේද වෛද්‍ය සභාවේ සියළුම සාමාජික භවතුන්

සෞඛ්‍ය, පොෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

ආයුර්වේද දෙපාර්තමේන්තුව

දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය

බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය

පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ

සියළුම පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන්

විගණකාධිපති දෙපාර්තමේන්තුව

නීතිපති දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව

සියළුම ජනමාධ්‍ය ආයතන

සියළුම දිස්ත්‍රික් ලේකම් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල

සියළුම ප්‍රාදේශීය ආයුර්වේද සංරක්ෂණ සභා

හා

**ආයුර්වේද වෛද්‍ය සභා කාර්ය මණ්ඩලය**